මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்லிக் வலயம் (watermark)

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පෙරදිග සංගීතය I | 09 ශ්‍රේණිය | කාලය : පැය 02 |
|---|---|---|

අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

**01.** ස රි ගප ධ ස̇ ස්වර යෙදෙන රාගය වන්නේ

1. බිලාවල් 2. යමන් 3. කාෆි 4. භූපාලි

**02.** ගප මග මරිස ලෙස ස්වර යෙදෙන රාගය

1. බිලාවල් 2. භූපාලි 3. යමන් 4. කාෆි

**03.** කළ්‍යාණ මේලයට අයත් රාගයකි.

1. බිලාවල් 2. භෛරවි 3. භූපාලි 4. කාෆි

**04.** රාගයක යෙදෙන ප්‍රබලම ස්වරය

1. වාදී වේ. 2. සංවාදී වේ. 3. අනුවාදී වේ. 4. විවාදී වේ.

**05.** රාගයක වර්ජිත ස්වර ලෙස හඳුන්වන්නේ

1. රාගය අලංකාර කිරීම සඳහා යොදා ගන්නා ස්වරයයි.
2. රාගයක නිතර නිතර යෙදෙන ස්වරයයි.
3. රාගයක නොයෙදෙන ස්වරයයි.
4. රාගයේ ප්‍රබලම ස්වරයයි.

**06.** C Major කෝඩ් එකට අයත් ස්වර වන්නේ

1. ස රි ප 2. ස ග ප 3. ස රි ග 4. ස ග ම

**07.** ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘ ලෙස හැඳින්වෙන්නේ

1. සී.ටී. ප්‍රනාන්දු 2. නෙවිල් ප්‍රනාන්දු 3. ජිප්සීස් 4. ත්‍රී සිස්ටර්ස්

**08.** රාගයක තිබිය යුතු අවම ස්වර ප්‍රමාණය වන්නේ

1. 3 කි. 2. 5 කි. 3. 7 කි. 4. 8 කි.

**09.** ස්වර සප්තකය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙන විකෘති ස්වරය වන්නේ

1. ග 2. ම 3. <u>නි</u> 4. ධ

10. මුලු ගතම වෙහෙසුනා ගීතය ඇතුළත් වන්නේ

1. නාට්‍ය ගී වලය. 2. නූර්ති ගී වලය.

3. කණ්ඩායම් ගී වලය. 4. නාඩගම් ගී වලය.

11. තන්ත්‍රිය සංගීත භාණ්ඩයක් වන්නේ

1. වයලීනය 2. සර්පිනාව 3. බටනලාව 4. තබ්ලාව

12. අපරදිග සංගීත සම්ප්‍රදායට අයත් සංගීත භාණ්ඩයකි

1.සිතාරය 2. එස්රාජය 3. ට්‍රම්පට් 4. සර්පිනාව

13. කුමටද සොබනියෙ කඳුලු සලන්නේ ගීතය ඇතුළත් නාට්‍යය වන්නේ

1. නරිබෑණා 2. හුණුවටය 3. මූදු පුත්තු 4. රතු හැට්ටකාරී

14. බටහිර සංගීතයේ යෙදෙන # සංකේතය හඳුන්වන්නේ

1. Flat නමිනි. 2. Sharp නමිනි. 3. Minim නමිනි. 4. Natural නමිනි.

15. බටහිර සංගීත වර්ගීකරණයට අනුව wind වර්ගයට අයත් භාණ්ඩයක් ලෙස දැක්විය හැක්කේ.

1.ට්‍රම්පට් 2. සයිඩ් ඩ්‍රම් 3. චෙලෝ 4. බැන්ජෝ

හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(තබ්ලාව , නූර්ති, ටයිම් සිග්නේචර්, හතරකි, සර්පිනා )

16. බටහිර සංගීතයේ තාලය හගවන සංකේතය.......................................... නම් වේ.

17. ලියමු මෙ සිංහල භාෂාවෙන් යන ගීතය ................................................ගීයකි.

18. නූර්ති ගී ගායනය කිරීම සඳහා යොදා ගත හැකි තාල වාද්‍ය භාණ්ඩය.................................වේ.

19. වයලින් පවුලේ සාමාජිකයන් ......................................... කි.

20. .................................... සුළඟින් හඬ නිපදවෙන භාණ්ඩයකි. (ල.2 x 20 = 40 )

## II කොටස

## පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.

**01.** පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. **(ල. 06 )**

| | රාගය | ආරෝහණ | අවරෝහණ | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|
| A | බිලාවල් | | | ගරි ගප ධනිසෘ |
| B | | සරිගපධසෘ | | සධ෴ සරි ගරිස |
| C | කාෆි | | | |

ii. ඉහත A හි සඳහන් රාගයට අදාළ සර්ගම් ගීතය ප්‍රස්තාර කරන්න. **(ල. 06 )**

**02.** / ධි - / ධි ධි න / ති - / - ධි න /

**i.** ඉහත තාලය නම් කරන්න. **(ල. 02 )**

**ii.** එම තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. **(ල. 04 )**

**iii.** එම තාලය වාදනය කරන තාල වාද්‍ය භාණ්ඩයේ නම ලියන්න. **(ල. 02 )**

**iv.** ඉහත තාලයට ගැලපෙන දේශීය තිත ප්‍රස්තාර කරන්න. **(ල. 04 )**

**03.** i. පහත දැක්වෙන ස්වර ඛණ්ඩය බටහිර ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන්න. **(ල. 06 )**

/ස ස ග ම / රි ග ප - /ම ප ම ග / ග ම ප - /

/ම ග ම රි / ග ම ප - / ප ම ග රි / ග රි ස - /

**ii.** පහත දැක්වෙන සංකේත ඇද දක්වන්න. **(ල. 06 )**

**a. Flat Mark** **b. Sharp Mark** **c. Treble cleff**

**04.** i. පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට හරවා ලියන්න. **(ල. 06 )**

/ස ස ග ග / රි රි ග - / ස - රි - / ග - - - /

/ස - රි - / ග - ම - / ග - රි - / ස - - - /

/ප - ප - / ම - ප ම / ග - ම ග / රි - - - /

/ස රි ග ම / ප - - - /ප ම ග රි / ස - - - /

ii. / ග ප ධ නි /සෘ - ධ ප / ම ග ම රි / ස රි ස - / පංචම භාවයෙන් ලියා දක්වන්න. **(ල. 04 )**

iii. ප්‍රකෘති හා විකෘති ස්වර **12** පංචම භාවයෙන් ලියා දක්වන්න. **(ල.02 )**

05. i. ඔබ කැමති නාට්‍යක ගීතයක් ලියා දක්වන්න. (ල.02 )

ii. පහත දැක්වෙන පාරිභාෂික පද කෙටියෙන් හඳුන්වන්න (ල.2 x 5 = 10 )

a. වාදී ස්වරය

b. වර්ජිත ස්වරය

c. ගානසමය

d. මුඛ්‍යාංගය

c. ආරෝහණ -අවරෝහණ

06. අපරදිග සංගීතයේ භාණ්ඩ වර්ගීකරණය කොටස් 03 කි.

i. එම වර්ගීකරණය ලියා දක්වන්න. (ල. 02 )

ii. ඉන් එක් වර්ගයකට අයත් සංගීත භාණ්ඩ 02 බැගින් දක්වන්න. (ල. 04 )

iii. අපරදිග සංගීත භාණ්ඩයක් ඇද කොටස් 03 ක් නම් කරන්න. (ල. 03 )

iv. වයලින් පවුල නම් කරන්න. (ල. 03 )